ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
ව්‍යවසායකත්වය හා කුඩා ව්‍යාපාර කළමනාකරණ වැඩ සටහන
අවසාන පරීක්ෂණය 2008/2009
ව්‍යවසායකත්වය - MCC 1201

OPEN UNIVERSITY OF SRI LANKA LIBRARY

කාලය පැය දෙකයි. (02)

දිනය : 2008.12.13 වේලාව: පෙ. ව.10.00 සිට මධ්‍යාහ්න 12.00 දක්වා

**ඕනෑම ප්‍රශ්න හතරකට (04) පිළිතුරු සපයන්න.**
**සෑම ප්‍රශ්නයකටම සමාන ලකුණු ලැබේ.**

1. 'උපතින්ම ව්‍යවසායකයින් වූවෝ පමණක් තම ව්‍යාපාර දක්ෂ ලෙස මෙහෙයවමින් සාර්ථකත්වයට පත් වෙති'. මීට උදාහරණයක් ලෙස සිද්ධාලේප වෙද මහතා සඳහන් කළ හැකිය. ව්‍යවසායකත්වය හා කුඩා ව්‍යාපාර කළමනාකරණය පාඨමාලාව හදාරන අයෙකු ලෙස ඉහත සඳහන් ප්‍රකාශය පිළිබඳ ඔබගේ මතය ගෙන හැර දක්වන්න.

2. ඔබ පදිංචිව සිටින ගම පිහිටා ඇත්තේ රත්නපුර නගරයට කි. මී. 27 ක් දුරින් යයි සිතන්න. ගමේ පවුල් 200 ක් පමණ පදිංචිව සිටින අතර ඉන් පවුල් 100 ක් පමණ කුඩා කුඹුරු හිමියන්ය. මෙම ගොවි පවුල්, එළවළු හා පලතුරු වගාවන්හිද නිරත වෙති. ගමේ පාසලේ ළමුන් 500 ක් පමණ ඉගෙනීමෙහි යෙදී සිටිති. 70 ක් පමණ වන කාර්යාල සේවකයින් සහ ශ්‍රම සැපයුම් කරුවන්ද, 30 ක් පමණ වන පාසැල් ළමුන් ද දිනපතා රත්නපුර නගරයට යති. ගමත් නගරයත් අතර ධාවනය වන එකම බස්රථය උදේ, දවල් සහ සවස යනුවෙන් නගරය කරා දිවෙන ගමන් වාර 3 කට සීමාවේ. කුඩා සිල්ලර බඩු කඩ දෙකක්ද, කුඩා රෙදි කඩයක්ද, තේ කඩයක්ද, බාබර් සාප්පුවක්ද, එළවළු හා පලතුරු අලෙවිකරන වෙළෙන්දෙක්ද ගමේ හන්දියේ ක්‍රියාත්මක වේ..

   සත් වසරක් විදේශ රටක රැකියාවක් කිරීමෙන් සැහෙන ධනයක් ඉපයූ ජයදාස මෙම ගමේ ව්‍යාපාරයක් ඇරඹීමට දැඩි කැමැත්තෙන් පසුවේ. සුදුසු ව්‍යාපාරයක් තෝරා ගැනීම සම්බන්දයෙන් උපදෙස් ලබා ගැනීමට ජයදාස ඔබ වෙත පැමිණියේ, එවැන්නක් සඳහා එකම සුදුස්සා ඔබ යැයි සැලකෙන බැවිනි.

   i ජයදාස විසින් ගමෙහි ඇරඹීමට යෝග්‍ය යයි ඔබ යෝජනා කරන ව්‍යාපාරය කුමක්ද? ඒ ඇයි දැයි සඳහන් කරන්න.

   ii ඔබගේ යෝජනාව සාධාරණීකරණය කරන්න. යුක්තිසහගත උපකල්පන වෙත් නම් ඒවාද සඳහන් කරන්න.

3. ව්‍යවසසායකත්වය හා කුඩා ව්‍යාපාර කළමනාකරණය පාඨමාලාව සාර්ථක ලෙස නිම කළ ඔබ, ඔබගේ ගම් ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 'සහාය ව්‍යවසාය සංවර්ධන නිලධාරී' තනතුරේ වැඩ අද දින භාරගත්තේ යයි සිතන්න. ඔබගේ වගකීම් හා යුතුකම් පහදාදීමෙන් අනතුරුව, ප්‍රාදේශීය ලේකම් තුමා ඔබ රැස්වීම් ශාලාව වෙත කැඳවා, එහි වාඩි වී සිටි තැනැත්තන් 7 දෙනෙකු පෙන්වා, ඔවුන් තමන් පදිංචි ප්‍රදේශවල කුඩා ව්‍යාපාර ඇරඹීමට අපේක්ෂා කරන බව සඳහන් කළේය. කෙසේ නමුත් ඒ සම්බන්දයෙන් කිසිදු අවබෝධයක් ඔවුනට නොමැති හෙයින් ඔවුන්ගේ උද්යෝගය හීනවී යාමට පෙර වහා ඔවුනට සහාය වීම වැදගත් බව ප්‍රාදේශීය ලේකම් මහතා සඳහන් කළේය. ව්‍යාපාරයක ඉදිරි දැක්ම, මෙහෙවර හා අරමුණු පිළිබඳ ප්‍රායෝගික උදාහරණ සමග පැහැදිලි කිරීමක් කරන ලෙසද ඔහු ඔබගෙන් ඉල්ලා සිටියේය. සතුටෙන් එම කාර්යය භාරගත් ඔබ එහි සිටි අය සමග ගත කළ මුල් විනාඩි කිහිපය තුළ දී ඔවුන් සියල්ලෝම අවම වශයෙන් අ. පො. ස. (සා. පෙළ) හොඳින් සමත් වූවන් බව දැන ගති. ව්‍යවසායකත්වයට අදාළව ප්‍රාදේශීය ලේකම් විසින් කරන ලද ඉල්ලීම ඉටු කරන අයුරු ඔබේ පිළිතුරෙන් පැහැදිලි කරන්න.

4. කුඩා ව්‍යාපාර අරඹන වේගයෙන්ම ඉන් බොහොමයක් වැසීයන බව නිතර දක්නට ලැබෙන සංසිද්ධියකි. කෙසේ වෙතත් සමහර ව්‍යාපාර වැසී යෑමක් හෝ වර්ධනය වීමක් නොමැතිව එකතැන රඳා සිටින ස්වභාවයක් පෙන්නුම් කරයි. මෙසේ වීමට හේතු විය හැකි ප්‍රධාන හේතු 4ක් දක්වන්න. මෙම හේතුවල සත්‍යාසත්‍යතාවය සාධනය කිරීම පිණිස ඔබ විසින් තෝරාගනු ලැබූ "එකතැන රැඳී සිටින" ව්‍යාපාර ස්ථාන 25ක අයිතිකරුවන් / කළමනාකරුවන් සමග පැවැත්වීමට යෝජිත සම්මුඛ සාකච්ඡාවකදී ඔබ විසින් විමසීමට අපේක්ෂා කරන ප්‍රශ්න 15ක් සඳහන් කරන්න.

5. පහත සඳහන් දෑ ගැන කෙටි සටහන් ලියන්න.
   i ව්‍යවසායකයෙකුගේ ගුණාංග
   ii කුඩා ව්‍යාපාරයන්හි ලක්ෂණ
   iii ව්‍යාපාර කුඩා වීමේ අවාසි

OPEN UNIVERSITY OF SRI LANKA
LIBRARY

**- හිමිකම් ඇවිරිණි. -**